# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2341/08 - 2023 ජූලි මස 17 වැනි සඳුදා - 2023.07.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති සමාගමක් වන, ලියාපදිංචි අංක පී. බී. 4833 දරන, උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගනු ලබන නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් ලිමිටඩ් ආයතනය (NSBM) සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසු, මේ නියමය මගින්, එකී පනත යටතේ සාදනු ලැබූ 2021 අප්‍රේල් මස 22 වන දින අංක 2224/26 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ I වන උපලේඛනය හා II වන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

1. I වන උපලේඛනයේ I වන කොන්දේසියේ "මහජන සෞඛ්‍ය හා පෝෂණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව" යන උපාධි නාමය වෙනුවට, "පෝෂණය හා සෞඛ්‍ය පිළිබඳ විද්‍යාවේදී ගෞරව"යන උපාධි නාමය ආදේශ කිරීමෙන්; සහ

2. II වන උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන "මහජන සෞඛ්‍ය හා පෝෂණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව" යන උපාධි පාඨමාලාව සහ ඊට අනුරූපව එම උපලේඛනයේ II වන තීරයේ දැක්වෙන උපාධි පාඨමාලාව සඳහා වන කෙටි යෙදුම සඳහා පහත දැක්වෙන උපාධි පා"මාලාව සහ කෙටි යෙදුම ආදේශ කිරීමෙන්:-

"

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා වන කෙටි යෙදුම* |
|---|---|
| පෝෂණය හා සෞඛ්‍ය පිළිබඳ විද්‍යාවේදී ගෞරව | බීඑස්සී ගෞරව (පෝෂණය හා සෞඛ්‍ය) |

"

ආචාර්ය **ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත** (පා.ම.),
අධ්‍යාපන අමාත්‍ය.

2023 ජූලි මස 14 වැනි දින,
කොළඹ දී ය.

EOG 07 - 0158/1

1A - PG 6389 — 286 (2023/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින්, 1959 අංක 23 දරන වරලත් ගණකාධිකාරිවරයන්ගේ ආයතනය පනත යටතේ පිහිටුවන ලද, අංක 30ඒ, මලලසේකර මාවත, කොළඹ 07 යන ස්ථානයේ පිහිටි, උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගනු ලබන ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරිවරයන්ගේ ආයතනය (ICASL) සම්බන්ධයෙන්, ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසු, මේ නියමය මගින්, එකී පනත යටතේ සාදනු ලැබූ 2023 මාර්තු මස 02 වැනි දින අංක 2321/64 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ II වන උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන, "රාජ්‍ය මූල්‍ය කළමනාකරණපති උපාධිය" යන සටහනට හා එහි II වන තීරයේ අනුරූප සටහනට ඉක්බිතිව ම, මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව සඳහන් සටහන්, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කොන්දේසිවලට යටත්ව එකතු කිරීම මගින් එම නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

**I වන උපලේඛනය**

***කොන්දේසි***

1. ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරිවරයන්ගේ ආයතනය (ICASL) විසින්, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් උපාධි වැඩසටහන් සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී අවම අධ්‍යයන සම්භාර 120 ක් සහිතව සම්පූර්ණ කළයුතු (SLQF 6 වන මට්ටම) ව්‍යාපාර විශ්ලේෂණය පිළිබඳ කළමනාකරණවේදී ගෞරව උපාධිය සම්බන්ධයෙන් සහ අවම අධ්‍යයන සම්භාර 90 ක් සහිතව සම්පූර්ණ කළ යුතු (SLQF 5 වන මට්ටම) ව්‍යාපාර විශ්ලේෂණය පිළිබඳ කළමනාකරණවේදී උපාධිය සම්බන්ධයෙන්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී ඕනෑම විෂයය ධාරාවක් යටතේ සාමාන්‍ය සාමාර්ථ ("S") තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතු ය.

2. නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පස් අවුරුදු (5) ප්‍රතිසමාලෝචනයට යටත්ව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන උපාධි පිරිනැමීම සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරයන්ගේ ආයතනය (ICASL) පිළිගනු ලැබේ.

**II වන උපලේඛනය**

| *I වන තීරය*<br>*උපාධි පාඨමාලාව* | *II වන තීරය*<br>*උපාධි සඳහා වන කෙටි යෙදුම* |
|---|---|
| ව්‍යාපාර විශ්ලේෂණය පිළිබඳ කළමනාකරණවේදී ගෞරව | බීඑම්ජීටී ගෞරව (ව්‍යාපාර විශ්ලේෂණය) |
| ව්‍යාපාර විශ්ලේෂණය පිළිබඳ කළමනාකරණවේදී | බීඑම්ජීටී (ව්‍යාපාර විශ්ලේෂණය) |

ආචාර්ය **ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත** (පා.ම.),
අධ්‍යාපන අමාත්‍ය.

2023 ජුලි මස 14 වැනි දින,
කොළඹ දී ය.

EOG 07 - 0158/2

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති සමාගමක් වන, ලියාපදිංචි අංක පී. වී. 9729 දරන, උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගනු ලබන රෝයල් ඉන්ස්ටිටියුට් ඔෆ් කලම්බු (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසු, මේ නියමය මගින්, එකී පනත යටතේ සාදනු ලැබූ 2023 අප්‍රේල් මස 28 වන දින අංක 2329/47 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ II වන උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන, "දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධිය" යන සටහනට ඉක්බිතිව ම, මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව සඳහන් සටහන්, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කොන්දේසිවලට යටත්ව එකතු කිරීම මගින් එම නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**I වන උපලේඛනය**

***කොන්දේසි***

1. රෝයල් ඉන්ස්ටිටියුට් ඔෆ් කලම්බු (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින්, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් උපාධි වැඩසටහන් සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී අවම අධ්‍යයන සම්භාර 120 ක් සහිතව සම්පූර්ණ කළයුතු (SLQF 6 වන මට්ටම) ජෛව වෛද්‍ය විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය සම්බන්ධයෙන්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී ජීව විද්‍යාව, රසායන විද්‍යාව, සහ භෞතික විද්‍යාව හෝ කෘෂි විද්‍යාව යන විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ ("S") තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතු ය.

2. නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පස් අවුරුදු (5) ප්‍රතිසමාලෝචනයකට යටත්ව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධිය පිරිනැමීම සඳහා රෝයල් ඉන්ස්ටිටියුට් ඔෆ් කලම්බු (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය හඳුනාගනු ලැබේ.

**II වන උපලේඛනය**

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා වන කෙටි යෙදුම* |
|---|---|
| ජෛව වෛද්‍ය විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව | බීඑස්සී ගෞරව (ජෛව වෛද්‍ය විද්‍යාව) |

**ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත** (පා.ම.),
අධ්‍යාපන අමාත්‍ය.

2023 ජූලි මස 14 වැනි දින,
කොළඹ දී ය.

EOG 07 - 0158/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.